## සිසු පැවරුම්

10.4.

### ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

1. ඕනෑම රටක පාලනය මෙහෙය වන ඉතා වැදගත් වන ආයතන 3ක් නම් කරන්න.
2. එම ආයතන වලින් සිදු කරන කාර්යයන් නම් කරන්න.
3. නීති සම්පාදනය කිරීම වර්තමානයේදී හා අතීතයේදී කරනු ලැබුයේ කුමන ආයතනය මගින් දැයි වෙන වෙනම දක්වන්න.
4. අතීත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ලෙස වෙනම ස්වාධීන ආයතනයක් නොවූයේ කුමන හේතුවක් නිසා ද?
5. එකල ව්‍යවස්ථාදායකය ලෙසත් ක්‍රියාත්මක වූයේ කුමන ආයතනය ද?
6. ක්‍රි:ව 9 වන සියවසේ පමණ ව්‍යවස්ථාදායකය හා විධායකය හැඳින්වූ පොදු නම කුමක් ද?
7. එම පදය සකස් වී ඇත්තේ කෙසේ ද?
8. එහි තේරුම කුමක් ද?
9. එකල වත්හිමි යන පදය යෙදුනේ කවුරුන් හැඳින්වීමට ද?
10. අතීතයේ රජය සතු ඉඩම් වෙනත් අයකුට පැවරීමේ දී මැදිහත් වූ ආයතනය කුමක් ද?
11. එම නිලධාරීන්ගේ රාජකාරිය කුමක් ද?
12. අතීතයේ දී මහලේ යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?
13. ඔහුට අයත් වූ කාර්යය කුමක් ද?
14. වසභ රජතුමා කාලයේ නාගදීපයේ ඉදිකළ විහාරය කුමක් ද, ඉදිකළ ඇමතිවරයා කවුරුන්ද?
15. අතීත ශ්‍රී ලංකාවේ පළාත් පාලනය පැවති බව උදාහරන දෙකක් ඇසුරින් විමසන්න.
16. දේවානම් පියතිස්ස රජ තුමාගෙන් පසු බලයට පත්වූ සොහොයුරන් 4 දෙනකු නම් කරන්න.
17. අතීත ශ්‍රී ලංකාවේ වෙජ්ජ ශාලා හා වෙජ යන පද යොදා ඇත්තේ කුමක් සඳහාද?
18. අතිතයේ උණ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඉදිකළ රෝහල කුමක් ද? එය කරවූ රජ තුමා කවුරුන් ද?

19. පළමු වන උපතිස්ස රජතුමා ඉදිකළ මාතෘ නිවාස කුමන නමකින් හැඳින්වේ ද?
20. සොත්ථි ශාලා භාවිතා කර ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද?
21. රුවන්වැලි සෑයට පූජාවක් කිරීම සඳහා පබළු ගෙන්වා ඇති රට කුමක් ද? එම පූජාව කරන ලද්දේ කුමන රජතුමාගේ කාලයේදී ද?
22. අතීත ශ්‍රී ලංකාව විදේශ රටවල් සමග පැවති සම්ප සබඳතා වල ස්වරූපය උදාහරණ දෙකක් ඇසුරින් විමසන්න.
23. වේලයික්කාර හමුදාව යනු කවුරුන් ද?
24. "පැරණි ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මයයි" කරුණු දෙකක් ඇසුරින් විමසන්න.
25. පැරුණි සෙල් ලිපි වල හේන් හඳුන්වා ඇත්තේ කෙසේ ද?
26. නව දැලි හේන් යන්නට අර්ථ නිරූපන දෙකක් දෙන්න.
27. කාලයක් අතහැර දමා ඇති හේනක් හඳුන්වා ඇත්තේ කෙසේ ද?
28. පැරණි ලංකාවේ හේන් ගොවිතැන වෙනුවෙන් අය කරන ලද බදු වර්ග දෙකක් ලියන්න.
29. අතීතයේ වී වගා කළ ප්‍රධාන කන්න දෙක නම් කරන්න.
30. පුරාණ ලංකාවේ කර්මාන්ත හා වෙළදාම සකස් වී තිබූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
31. සෙල් ලිපි වල කිරි ගෙරි ලෙස හඳුන්වා ඇත්තේ කුමන සතුන් ද?
32. පුරාණ ලංකාවේ ඇති කරන ලද සතුන් 3 දෙනකු නම් කරන්න.
33. පුරාණ ලංකාවේ පැවති කර්මාන්ත 4 ක් නම් කරන්න.
34. පහත සඳහන් වචන අතිතයේ භාවිතා කර ඇත්තේ කුමන වෘත්තිකයන් සඳහාදැයි ලියා දක්වන්න.

1. කබර 2. තුලාධාර 3. ස්වර්ණකාර 4. දටික සුමන 5. කුඹකර 6.තතවය

35. අතීත ලංකාවේ පැවති ප්‍රධාන වෙළඳ නගර දෙකක් නම් කරන්න.
36. පහත සඳන් ඒවා හඳුන්වන්න.

1. අබල වපර 2. වාපර 3. කබොජ මහ පුගිය

37. නානාදේසි, වලඤ්ඤියාර් අයින්නුරුවර් යනුවෙන් සෙල්ලිපි වල සඳහන් වන්නේ මොනවාද?
38. ශ්‍රී ලංකාවට දන්ත ධාතූන් වහන්සේ වැඩම කල වරාය කුමක් ද?

39. අතීත ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තිය හා වෛද්‍ය වෘත්තීය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

40. පහත සඳහන් වචන හඳුන්වන්න.

1. මහ වෙදනා 2. වොහාර 3. විතකර(ලපන)

41. අතීත ශ්‍රී ලංකාවේ පහත සඳහන් ඒවා භාවිතා කරන ලද්දේ කුමක් හැඳින්වීමට ද?

1. පණ්ණශාලා 2. අන්තේ වාසික 3. සදි විහරිය

4. භානකවරු 5. වස්සාවාසික සාධක 6. දමෙඩ

42. දැනට සොයා ගෙන ඇති පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය කුමක් ද?

43. අතීත ශ්‍රී ලංකාවේ පැවති (බුදු දහම හැර) වෙනත් ආගම් දෙකක් පිළිබඳව විමසීමක් කරන්න.

44. අතීත ලංකාවේ පැවති බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව විමසීමක් කරන්න.

45. අතීත ලාංකිකයන් වාර්ගික සහජීවනය උසස් ලෙස සැලකූ අයුරු උදාහරණ මගින් පෙන්වා දෙන්න.